# මූලාශ්‍රයන්ගෙන් හෙළිවන බලි සංකල්පය පිළිබඳ අධ්‍යයනයක්

පාහියංගල සුමංගල හිමි

## අධ්‍යයන සංක්ෂිප්තය

ඉතිහාසය පුරාම මිනිසා තමන් විසින් මුහුණ දුන් ජීවිත ගැටලුවලට හා සිය අවශ්‍යතාවන් පිරිමසා ගැනීමට නොයෙක් විශ්වාස පදනම් කරගනිමින් විවිධ ඇදහිලි සිදු කරන්නට යෙදුණි. සමාජයට හෝ පුද්ගලයාට ඇතිවන බොහෝ උවදුරුවලට හේතුව තේරුම් ගැනීමට ආදි කල්පිතයාට නොහැකි විය. ඒවා බොහොමයකට හේතු ඔවුන්ට ගුප්ත විය. කලට වැසි නොවසින්නේත්, බියකරු ලෙඩරෝග පැතිර යන්නේත් දෙවියන් කෝප වීම නිසා යැයි ඔවුහු සිතුහ. මෙවැනි අවස්ථාවක ඔවුහු සමාජයේ සම්මත ශාන්ති කර්ම කෙරෙහි හෝ විවිධ අසාමාන්‍ය බලවේග ඇතැයි විශ්වාස කරන ස්ථාන කරා ගොස් ඉන් මිදීමට උත්සාහ කළහ. අතීතයේ සිට මිනිසුන්ට බලපාන විවිධ උවදුරුවලින් මිදීම සඳහා බලි යාගය නොහොත් බලි ශාන්ති කර්මය මිනිසුන් අතර ප්‍රචලිතව පැවැති ඇත. මෙම බලි සංකල්පය කවදා කුමන ප්‍රදේශයක ආරම්භ වන්නට ඇතැයි නිශ්චිතව සඳහන් කළ නොහැකි අතර මූලාශ්‍රය අධ්‍යයනය තුළින් එහි ආරම්භය සහ භාවිතය පිළිබඳ යම් අදහසකට පැමිණිය හැකිය. මූලාශ්‍රය අධ්‍යයනය තුළදි බලි යන වචනය සාමාන්‍ය ජන සමාජය, ඉහළ සමාජ පැලැන්තිය සහ බෞද්ධ ඉතිහාසය තුළ භාවිතය පිළිබඳවද අවධානය යොමු කළ හැකිය.

## අධ්‍යයන ප්‍රවේශය

බලි සංකල්පය වර්තමානයේදී පමණක් නොව අතීත සමාජවල ජීවත් වූ මිනිසුන් අතර පවා ජනප්‍රිය වී පැවතුණු බව සාහිත්‍යය මූලාශ්‍රයන්හි දැක්වෙන කරුණු මගින් සනාථ වේ. "බලි" යන්න විග්‍රහ කරන විට ලිඛිත සිංහල සාහිත්‍යයේ ද, බෞද්ධ සාහිත්‍යයේ හා සෙල්ලිපිවල සඳහන් තොරතුරු ද වැදගත් වේ. ප්‍රාග් බෞද්ධ



යුගයේ පණ්ඩුකාභය රාජ්‍ය සමයේ පැවති වත් පිළිවෙත්වලින් ද මේ බැව් තහවුරු වේ. පණ්ඩුකාභය රජු චිත්තරාජ, කාලවේල, වළවාමුඛි, වෙසමුණි නම් වූ යක්ෂයින්ට සහ ව්‍යාධ දේව නම් වූ දෙවියන්ට පුද පූජා කළ බව මහාවංසය පෙන්වා දෙයි.[1] පුද පූජා, චාරිත්‍ර කළා පමණක් නොව චිත්තරාජ නම් යකු සමඟ සම අසුන්හි හිඳ දෙව් මිනිස් නාටක නැරඹූ බව ද එහි සඳහන් වේ. මීට සමකාලීනව මහේජ, ජුතින්දර, විභීෂණ, කාලාශෝධර නම් වූ යක්ෂයන්ට ද, පච්ඡිම රාජිණී නම් දෙවඟනට කළ පුද පූජා පිළිබඳව ද ඉතිහාසයේ දැක්වේ. මෙම බලි දීම පිළිබඳව මහාවංස ගීතය තුළ ද තොරතුරු අන්තර්ගත වේ.

"අන්තො නරින්ද වත්ථුස්ස - වලවාමුඛ යක්ඛිණිං
නිවෙස්සෙ බලිං තෙසං - අඤ්ඤෙසඤ්චානු වස්සකං"
(වඩබාමුඛ යකුකිනි - රජ උයන තුළ වැස් වී
උන්හටත් අන් හැමටත් - වස් පතා බලි දන් දිනි)
(මහාවංස ගීතය, 1993, 86, 89 ගාථා)

"දාපෙසි ජන කාලෙතු - චිත්ත රාජෙන සොසෙහ
සමාසනෙ නිසීදිත්වා - දිබ්බ මනුස්ස නාටකං"
(නැකැත් කෙළි දිනවලැ - චිත්ත රාජ සමඟ රජ
සමසුන් ගෙනැ දිව් මිනිස් - නැටුම් කෙළියට සිත් දිණ)[2]

"සෙත කාලවේල මිත්තෙහි - දිස්සමානෙහි භූපති
සහානුභොසි සම්පත්තියං - යබෙ භූත සහායවා"
(යක්හු මිතුරු රජ - දිවමන් කාලවේලද
චිත්ත රාජයද සමගින් - විත්දේ ඉසුරු සුවසිරි)[3]

මෙම කරුණු පිළිබඳව වල්පොල රාහුල හිමියන් විසින් මෙසේ සඳහන් කොට තිබේ. "පණ්ඩුකාභය රජ, කාලවේල හා චිත්තරාජ යක්ෂයන්ට ද, පූර්ව ආත්මයේදී ද සිය මෑණියන්දෑගේ දාසියව සිටි චිත්තා නම් වූ යක්ෂණියට ද වාසස්ථාන සලසා දුන්නේය. මේ තිදෙන හැරෙන්නට වළවාමුඛි යක්ෂණියට ද ඔහු රජ ගෙ උයන ඇතුළතම

දෙවොලක් කරවා මොවුන් සියල්ලන්ටමත් වෙනත් යක්ෂයන්ටත් අවුරුද්දක් පාසා බලි බිලි දුන්නේය".[4] එම කරුණ පිළිබඳවම මුදියන්සේ දිසානායක විසින් ද අර්ථ විවරණ ඉදිරිපත් කොට තිබේ. ඒ මෙසේ ය."....කෝට්ටේ කාලයට පෙර ලංකාවේ බලි තිබුණු බවට යම් යම් සාධක වංසකතාවල දැක්වේ. ක්‍රි. පූ. 4 වන ශතවර්ෂයේ පණ්ඩුකාභය රජුගේ කාලයේ ඔහුට රාජ්‍ය බලය ලබාගැනීම සඳහා චිත්තරාජ, කාලවේල, වළවාමුඛි යන යක්ෂයන් ආධාර කළ බවත්, මේ නිසා ඔවුන්ගේ ගුණ සිහි කිරීම පිණිස ආරාම සාදා බලි පූජා කරන්නැයි මිනිසුන්ට අණ කළ බවත් කියැවේ."[5] මහාවංසයේ දක්වා ඇති පරිදි රාජ්‍ය පාලකයින්ට අනාවැකි පළ කළ මන්ත්‍ර දත් බමුණෝ අතීතයේ වාසය කර තිබේ.[6] මහාවංසය තුළ තවදුරටත් මෙම බලි සංකල්පය පිළිබඳව තොරතුරු දක්වා තිබේ.

"ආජීවකානං ගෙහංච බ්‍රාහ්මණාවට්ටමේවච

සිවිකා සොත්ථිසාලාච උභසමචං"

මෙහි සඳහන් වන පරිදි නගරයට උතුරු දෙසින් වන්නට ඉදිකර ඇති ගොඩනැගිලි සිවිකා ශාලාවක් යැයි සිතීමට වඩා ශාන්තිකර්ම කරන ලද ස්ථානයක් ලෙස හඳුනාගැනීම යෝග්‍ය බව විනී විතාරණ විසින් දක්වා තිබේ.[7]

බලි යන පදයට අර්ථ නිරූපණ පහක් ඉදිරිපත් කිරීමට සිරි ලියනගේ (ජනශ්‍රැති ශබ්ද කෝෂය) සමත්ව ඇත.[8]

බලි - අ - මෝඩ, බාල

ආ - බලවත්, බලය ඇති, ශක්තිමත්

ඇ - විශාල, මහත්

ඈ - දේව, යක්ෂ, ප්‍රේතාදීන්ට පිරිනමන පූජා, යක්ෂ ප්‍රේතාදීන්ට කරන ශාන්ති කර්ම, තොවිල් ආදිය

ඉ - බද්ධ, කප්පම, දීමනාව

බලි යන්න පිළිබඳව විමසා බැලීමේ දී ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය තුළ ද බලි යන පදයට අර්ථ සපයා ඇත."දේව යක්ෂාදීන්ට දෙන පිදේනි බලි යනුවෙන් හඳුන්වන අතර එම බලවේගයන් විසින් ඇති



කරනු ලබන ග්‍රහ අපල ආදිය දුරුවීම සඳහා කරනු ලබන ශාන්තිකර්ම බලි ශාන්තිකර්ම ලෙස හඳුන්වනු ලබයි".[9] බලි සංකල්පය පිළිබඳව නර්තන වාග් කෝෂයෙහි සඳහන් කර ඇත්තේ එය මිනිසුන් විසින් ඇතිකරගත් සාම්ප්‍රදායික ඇදහිලි හා විශ්වාස මත කරනු ලබන්නා වූ පුද පූජා විශේෂයක් වශයෙනි.[10]

ලිඛිත සාහිත්‍යයෙහි විවිධ ශාන්තිකර්ම පිළිබඳව සඳහන් වේ. ඒ අතර බලි කර්මාන්ත, බලි ක්‍රියා, බලි තැබීම, බලි බිලි, බලි බත් ආදිය ගැන සඳහන් වෙතත් එම කාර්ය පිළිබඳව පැහැදිලි විස්තර සඳහන් නොවේ. බලි යනු සිංහලයෙහි සේම සංස්කෘත, පාලි සහ ප්‍රාකෘත යන භාෂාවල ද එකම අරුත් සඳහා යෙදෙන වචනයක් ලෙස මේ සම්බන්ධව වඩාත් වැදගත් ශාස්ත්‍රීය පර්යේෂණයක් සිදු කර ඇති මහාචාර්ය විනී විතාරණ මහතා දක්වා තිබේ. "බලි යනු සිංහලයෙහි සේම සංස්කෘත, පාලි සහ ප්‍රාකෘත යන භාෂාවල ද යෙදෙන වචනයකි. එම අරුත් වනාහි දේව, යක්ෂාදීන්ට දෙනු ලබන පිදේනි, යාච්ඤා සහ ශාන්තිකර්ම සඳහා අඹන රූප යනුය".[11] එමෙන්ම බලි යන පදය සම්භාව්‍ය සාහිත්‍යය තුළ ද දැකගත හැකිය. "බලි" යන්න සිංහලයේ දී බිලි බවට පත්වී ඇත. එය සම්භාව්‍ය සාහිත්‍යය තුළ අන්තර්ගත වන්නේ මෙසේය. "බිලියම්, බිලි බඳුන්, බිලි කැවුම් වශයෙන් මුල් කාලයේ සඳහන් වුව ද කල් ඇවෑමෙන් බලි යන්නෙහි මුත් අරුත් සීමා වූවා සේ පෙනෙයි. මේ බලි යනු බලි යාගය හෝ බලි රූපය නොවේ. යක්ෂාදීන් වෙත කැප කරනු ලබන ප්‍රාණයෙන් යුක්ත පිදෙන්නක් වෙයි".[12]

මෙම කරුණු දෙස බලන විට "බලි" යන්න සම්භාව්‍යය සාහිත්‍යය තුළ ද "බිලි" ලෙස සඳහන් වන බවත්, එහි අර්ථය අජීවී යමක් නොවන බවත්, ඇදහිලි සහ විශ්වාස මුදුන් පමුණුවා බලි යන්න ව්‍යවහාර කර ඇති බවත් පැහැදිලි වේ. "ඍග් වේදයෙහි රජුට දෙන තෑග්ගක් යන අර්ථයෙන් ද, දෙවියන්ට කරනු ලබන පූජාවක් යන අර්ථයෙන් ද "බලි" යන පදය යෙදී තිබේ. එසේම පශ්චාත් කාලීන බ්‍රාහ්මණ, උපනිෂද් හා සූත්‍ර භාවිතයෙහි ද, මුල් බෞද්ධ සාහිත්‍යයෙහි ද මෙකී අර්ථ දෙකෙන්ම "බලි" යන පදය ව්‍යවහාරිතය".[13] මේ අනුව අවධානය යොමු කරන විට "බලි" යන්නෙහි ධ්වනිතාර්ථය පරිත්‍යාගයක්, තෑග්ගක් දීම යන්නයි.

25 MAY 2022

වෛදික සාහිත්‍යයේ මෙන්ම බෞද්ධ පාලි සාහිත්‍යයේ ද "බලි" යන පදය පූජාර්ථයෙන් යුතුව සලකනු ලැබ ඇති බැව් පැහැදිලි වේ. උපත් වේලාව පිළිබඳව බලවත් විශ්වාසයක් සිංහල සමාජයේ ඇති අතර ජන්ම පත්‍රය බලා දුක් කරදරවලින් මිදී සෞභාග්‍යය ලබා ගැනීමට බලි ශාන්තිකර්මය සිදු කරනු ලැබේ. "ගණ්ඩතින්දු" ජාතක කථාවෙහි "බලි පිළිතා රට්ඨ වාසිනො" යැයි යෙදී ඇත්තේ රජු වෙනුවෙන් අය කළ බද්දකින් රටවැසියා පෙළී සිටි බව දැක්වීමටයි.[14] "බලි" යන්න අර්ථ දැක්වීමේ දී ඒ පිළිබඳව බෞද්ධ සාහිත්‍යයෙන් ද කරුණු රාශියක් අනාවරණය කරගත හැකිවේ. බුදුරජාණන් වහන්සේ අංගුත්තරනිකායේ "පත්ත කම්ම සූත්‍රයෙහි" පස් වැදෑරුම් බලියක් පිළිබඳව මෙසේ සඳහන් කොට තිබේ.[15]

"පුනච පරං ගහපති අරියසාවකෝ උට්ඨාන විරියාධිගතෙහි භොගෙහි බහා බල පරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකේහි ධම්ම ලද්ධොහි පඤ්ච බලිකත්තා හොති ඤාති බලිං, අතිථි බලිං, පුබ්බපෙත බලිං, රාජ බලිං, දේවතා බලිං ඉදමස්ස තතියං ඨානංගතං හොති පත්ත ගතං ආයතනසො පරිභුත්තං"

මෙම පස් වැදෑරුම් බලිය නම්,

1. ඤාති බලි - නෑයින්ට දෙන දීමනා
2. අතිථි බලි - ආගන්තුකයින්ට දෙන දීමනා
3. පුබ්බපෙත බලි - මියගිය ඇත්තන්ට දෙන දීමනා
4. රාජ බලි - රජයට දෙන ආදායම් බදු දීමනා
5. දේව බලි - දෙවි දේවතාවන්ට දෙන දීමනා ආදී වශයෙනි.

මෙම පස් වැදෑරුම් බලි පුදන ජනයා සතුටින්, සුවයෙන් හා යහෙන් ජීවත් වන බව තවදුරටත් එහි මෙසේ දක්වා තිබේ. "භුතතා භොගා භතා භච්චා විතිණ්ණා ආපදාසු මෙ උද්ධග්ගා දක්ඛිණා දින්නි අථො පංච බලිකතා උපට්ඨිතා සීලවන්තො සඤ්ඤතා බ්‍රහ්මචාරයෝ".[16] එහි අර්ථය මෙසේය. (මා විසින් භෝගයෙන් වළඳන ලදහ. පෝෂණයට නිසියෝ ද පුස්නා ලදහ. සිල්වත්, සංයත වූ බ්‍රහ්මචාරීහු වටන ලදහ.) සමස්තයක් වශයෙන් ගත් විට "බලි දීම" ජීවත් කරවීම පහසු කරවන අධි ශක්තියෙන් යුත් කාර්යයක් වශයෙන්



පිළිගැනුණු බව පෙනේ. බලි ශාන්තිකර්මය සෑම විටම අදෘශ්‍යමාන බලවේග අරමුණු කරගනිමින් පැවැත්වීම තුළින් ඒ බව පැහැදිලි වේ. පෙරදිග මහා වෛද්‍ය සම්ප්‍රදාය වන අෂ්ටාංගික ආයුර්වේදය සකස් කරන ලද "චරක" මුනිවරයා විසින් ද භූත විද්‍යාව වැදගත් තැනෙක ලා සලකන ලද බව පෙනේ. එහි එන අංග අට මෙසේය.[17]

1. කාය චිකිත්සා
2. ශාලාක්‍ය චිකිත්සා
3. ශල්‍යාපහරණ චිකිත්සා
4. විෂ-ගර වෛරොධිත චිකිත්සා
5. භූත විද්‍යාව
6. කෞමාර භෘත්‍ය
7. රසායන චිකිත්සා
8. වාජිකරණ චිකිත්සා

මේ අනුව අෂ්ටාංග ආයුර්වේදයේ පස්වන අංගය වන භූත විද්‍යාවට අයත් වන්නක් ලෙස "බලි" යන්න පෙන්වා දිය හැකිය. බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩ සිටි කාලයේදී ද බලියාගය පිළිබඳ අවබෝධයක් තිබුණු බවට නොයෙකුත් සාධක දැක්විය හැකිය. රතන සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත්තේ මෙලොව යහපත සඳහා බලි දීම වරදක් නොවන බවයි.

"දිවාච රත්තොච හරන්ති යෙ බලිං
තස්මාහි නෙ රක්ඛථ අප්පමත්තා"

මීට අමතරව ජාතක පොතෙහි එන ඇතැම් ජාතක කතා වලින් ද බලි දීම පිළිබඳව යම් යම් කරුණු අන්තර්ගත වී තිබෙන ආකාරය හඳුනාගත හැකිය. වෙළෙඳාම පිණිස යන්නන් සතුන්ගේ රුධිරයෙන් භූතයින් පිදූ බව "ආයාචිත භත්ත" ජාතකයේ කියැවේ.[18]

"ඒ කාලයෙහි වනාහි මනුෂ්‍යයෝ වණික් කර්මාන්තය පිණිස යන්නාහු මංග, සූකරාදී ප්‍රාණීන් ඝාතනය කොට අපි අන්තරායක් නැතිව අත්ථි සිද්ධියට පැමිණ අවුත් නැවත නුඹ වහන්සේලාට බලි පූජා කරමහයි, කියා ආරාධනා කොට යන්නාහුය. එසේ ගිය තත්හි

අන්තරායක් නැතිව අර්ථ සිද්ධියට පැමිණ ආවාවූ දේවතානුභාවයෙන් මේ අර්ථ සිද්ධිය වූයේ යැයි සිතමින් උරන්, මුවන් ආදී වූ බොහෝ ප්‍රාණීන් නිසා යාඥාවෙන් මිදෙනු පිණිස බලි පූජා කරන්නාහුය."

17වන සියවසෙහි මුල භාගයේ දී රචිත අලගියවන්නයන්ගේ "කුස්තන්තීනු හටන" නම් කෘතියෙහි එන පද්‍යයක මෙසේ බලි යන්න දක්වා තිබේ.

"නෙක සිත්තම් සැදි මනර ම
සිරිමත් සුර විමනක් ස ම
යහපත් බලි බත් කුඩ ම
ගිනිගත් රඟ කියනුය කි ම"

මෙම පද්‍යයේ සඳහන් වන ආකාරයට "අන්තෝනි බරෙන්තු" නම් සෙබළ නායකයා විසින් සිය මධ්‍යස්ථානය වන "මැදදේගම" ඉදිකරන ලද ගොඩනැගිල්ලක් ලෙස හඳුන්වන "බලි බත් කුඩම" යන්නෙහි අරුත දක්වා ඇත්තේ දාන ගෘහය, බලි පිණිස බත් දෙන තැන දාන ශාලාව යනුවෙනි.

බලි මන්දිර, බලි වෙළුම, බලි සදම යන නම්වලින් කියැවෙන දේව පූජා පවත්වන බලි ශාලා පුරාතනයේ පැවතුණු බවට සාක්ෂ්‍ය ලැබෙන අතර පණ්ඩුකාභය රාජ යුගයෙහි කියැවෙන සොත්ථි ශාලාව ද මෙවැන්නක් බව විද්වතුන්ගේ මතයයි.[19] මෙහිදී ඇදුරා, මිනිසා අපල උපද්‍රව ආදියෙන් මුදවා ඔවුන්ට සෞභාග්‍ය ලබාදීම ආතුරයාට දෙනු ලබන ත්‍යාගය වශයෙන් සලකයි. ඒ අනුව "බලි" යන්න තෑග්ගක් දීම ලෙස සලකන්නට ඇතැයි ද සිතිය හැකිය.

"10වන සියවසට අයත් සෙල්ලිපි කිහිපයක "බිලි" යන්න යෙදෙන්නේ තැගි බෝග වශයෙන් දෙනු ලබන බත් සහ සහල් වැනි දෙයක් වෙනුවෙනි (මිහින්තලා, ඊරිපිනියාව, රඹෑව ලිපි) "බිලි බත්" සහ "බිලි සහල්" යනු එහි එන වහරය".[20] බුද්ධකාලීන භාරතයෙහි "බලි" යන පදය ව්‍යවහාර වී ඇත්තේ රජුට කැමැත්තෙන් දෙන තෑග්ගක් ලෙස හෝ අනිවාර්ය බද්දක් ලෙස හෝ බව සාහිත්‍යය දෙස බලන විට ගම්‍ය වේ. බ්‍රාහ්මණයින් විසින් ද දළ රැගුම් විලාසවලින් සංස්කෘත ශ්ලෝක ගායනා කරමින් බලි යාග පවත්වා තිබෙන බවට



ජේ. ඊ. සේදරමන් බලියාග විචාරය නම් කෘතියෙහි දක්වා තිබේ." නක්ෂත්‍ර යෝග අනුව මන්ත්‍ර පූජා බිය ද, ස්තෝත්‍ර ගායනා ද, මෙම යාග ක්‍රමයේ ප්‍රධානතම අංගය ලෙස පැවතිණි".

තිස්ස කාරියවසම් සිය බලියාග පිළිවෙළ නම් ග්‍රන්ථයෙහි ඉදිරිපත් කර ඇති පරිදි දීඝනිකායේ නරවරයාට දෙනු ලබන ත්‍යාගය හෙවත් බද්ද ලෙස බලි හඳුන්වා තිබේ (ධම්මිකෙන බලිනා). එමෙන්ම "බලි" යනු දෙවියෙකුට කරනු ලබන පිදවිල්ලක් ලෙසට ද එහි දක්වා තිබේ. "භවං බො පන රාජා බලිං උද්ධරෙය්‍ය අකිච්චකාරී අස්සතෙන භවං රාජා" රතන සූත්‍රයේ දී බුදුන් වහන්සේ විසින් දවල් කාලයේත්, රාත්‍රී කාලයේත් බලි ගෙනවිත් පුදන සියලු මිනිස් වර්ගයා වෙත මෛත්‍රිය පතුරුවන ලෙසට දක්වා තිබේ.[22]

"තස්මාහි භූතා නිසාමේථ සබ්බේ

මෙත්තං කරොථ මානුසියා පජාය"

බලි සංකල්පය පිළිබඳව සාහිත්‍යය මූලාශ්‍රයවල සඳහන් කරුණු පිළිබඳව විග්‍රහයක් ඉදිරිපත් කරන කාරියවසම් ඒ පිළිබඳව තවදුරටත් මෙසේ දක්වා තිබේ.[23]

"බුද්ධකාලීන සමාජයෙහි "බලි" යන පදය ව්‍යවහාර වී ඇත්තේ රජුට කැමැත්තෙන් දෙන තෑග්ගක් ලෙස හෝ අනිවාර්ය බද්දක් ලෙස හෝ බව සමකාලීන සාහිත්‍යයෙන් පැහැදිලි වේ. ඒ කාලය වන විට අනිවාර්යය බද්දක් බව "බලි" යන්න සමඟ "දණ්ඩ" යන පදය ද එකට යෙදී තිබීමෙන් පෙනේ. කුලාවක ජාතකයෙහි ද, මහා සුපින ජාතකයෙහි ද, ධම්මපදට්ඨ කතාවෙහි ද මේ අරුතින් "දණ්ඩ බලි" යන පද යෙදී තිබේ. මේ අනුව මෙම කෘතිවල "බලි" යන්න යෙදුණේ "රාජ බලි" යන අරුතින් බව පැහැදිලිය. මේ අනුසාරයෙන් දෙවිවරුන්ට දෙන පූජාවන්ට ද "බලි" යන්න යෙදී තිබේ. "දේව බලි" යනුවෙන් නම් කළ හැකි මෙකී පූජා ලැබුවේ දෙවිවරුන් පමණක්ම නොවේ. සමහර විට අමනුෂ්‍යයෝ ද ඒවා පිළිගත්හ. එහෙයින්ම බෞද්ධ සාහිත්‍යයෙහි භූත, නාග, යක්ඛ හා දේවතාවන් වෙනුවෙන් දුන් බලි පූජා ගැන ද සඳහන් වේ. මෙහිදී මේ පිදවිලි කරන ලද්දේ පූජාවක් හෝ යාගයක් ලෙස විය යුතුයි. මේ අන්දමින් දෙවියන්, යකුන්

හා නාගයින් වෙනුවෙන් පැවැත් වූ පුද පූජා "බලිකම්ම" යනුවෙන් හැඳින්වේ. දීඝනිකායේ වජ්ජීන් විසින් බලි පිදූ බව බුදුන් වහන්සේ දේශනා කර ඇත. සුමංගලවිලාසිනී අටුවාවේ මේ පිළිබඳව විස්තර කරන විට එකී බලි පුදා ඇත්තේ සාරන්ද නම් යකෙකුට බව කියැවේ. අභිදානප්පදීපිකාවේ කපුටා හැඳින්වෙන්නේ "බලිපුට්ට" නමිනි. සුත්තනිපාතයෙහි දුක් දුරු කර ගැනීමට භූතයින්ට බලි දීම් ගැන කියැවේ. මහාසුතසෝම ජාතකයෙහි ලෙඩ රෝග සුවපත් කර ගැනීම සඳහා දෙවියන්ට බලි පුදන බව කියැවේ. දුම්මේධ ජාතකයෙහි දූ දරුවන් ධාන්‍ය සහ සම්පත් ලබා ගැනීමට නුග ගසක සිටින දෙවියන්ට යදින වැකියක් ගැන කියැවේ. මෙම ජාතක කථාවෙහිම ඒ පුරයේ වැසියන් බලි කම්ම ඇතුළත් දේවතා මංගලිකා පැවැත්වූ බව කියැවේ. පුරයට පිවිසීමට අළුත් දොරටුවක් තනන විට බ්‍රාහ්මණ බලියක් පුදන බව තක්කාරිය ජාතකයෙහි කියයි."

මේ ආකාරයට සාහිත්‍යගතව දැක්වෙන්නා වූ විවිධ තොරතුරු මගින් බලි සංකල්පය ඉතා ඈත අතීතයේ පටන් ශ්‍රී ලාංකේය සමාජය තුළ මුල්බැසගත් ආකාරයක් හඳුනාගත හැකිය. ලිඛිත සාහිත්‍යයේත්, බෞද්ධ හා වෛදික සාහිත්‍යයේත්, සෙල්ලිපි ආදියෙහි සඳහන් වන තොරතුරු මගිනුත් ඒ බව පැහැදිලිවම සනාථ කරගත හැකිය. ප්‍රාග් ඓතිහාසික යුගයේ පටන්ම මිනිසා තුළ ඇතිවී තිබූ මෙම බලි සංකල්පයේ ඓතිහාසික පසුබිම හා ආරම්භය පිළිබඳව සලකා බැලීමේ දී මෙවැනි සාහිත්‍යගත තොරතුරුවලින් හෙළිවන කරුණු වලින් ඉමහත් පිටිවහලක් ලබාගත හැකිය. ඒ අනුව බලි සංකල්පය වූ කලී මෑත අවධියේ නොව අනාදිමත් කාලයක සිට දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන්නා වූ සංකල්පයක් ලෙස හඳුනාගත හැකිය.

**ආන්තික සටහන්**

1. මහාවංසය, (සංස්) සුමංගල හිමි, බටුවන්තුඩාවේ; 19 පරිච්ඡේදය, සී/ස ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1908, ගාථා 54-61.
2. මහාවංස ගීතය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ, 1993, ගාථා 87-90.
3. එම, ගාථා 104-107.
4. රාහුල හිමි, වල්පොල. ලංකාවේ බුදු සමයෙහි ඉතිහාසය, සී/ස ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1970, පිටු 41.



5. දිසානායක, මුදියන්සේ, සිංහල නර්තන කලාව, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 675, පී. ද ඇස් කුලරත්න මාවත, කොළඹ, 1998, පිටු 211.
6. මහාවංසය, (සංස්) වීරසේකර, ගුණපාල; අනුලා මුද්‍රණාලය, කොළඹ, 1960, පිටු 146-147.
7. විතාරණ, විනී, බලි යාගය, මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ ප්‍රකාශනයකි, 1992, පිටු 5.
8. එම, පිටු 5.
9. සෝරත හිමි, වැලිවිටියේ, ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය, 1 කාණ්ඩය, අනුලා මුද්‍රණාලය 675, පී. ද ඇස් කුලරත්න මාවත, කොළඹ, 1970, පිටු 10-20.
10. දිසානායක, මුදියන්සේ, නර්තන වාග් කෝෂය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2001, පිටු 869- 878.
11. විතාරණ, විනී, බලි යාගය, මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ ප්‍රකාශනයකි, 1992, පිටු 6.
12. එම, පිටු 6.
13. කාරියවසම්, තිස්ස, බලියාග පිළිවෙල. සමයවර්ධන මුද්‍රණාලය, කොළඹ 10, 1986, පිටු 13.
14. එම, පිටු 13.
15. පියසේන, ධර්මසිරි, ඌවේ බලි යාග ශාන්තිය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 675, පී. ද ඇස් කුලරත්න මාවත, කොළඹ 10, 1988, පිටු 22.
16. එම, පිටු 17.
17. බුද්ධදාස, ආර්, අෂ්ටාංගහෘදය සංහිතාව, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, කොළඹ, 1960, පිටු 206.
18. පියසේන, ධර්මසිරි, ඌවේ බලි යාග ශාන්තිය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 675, පී. ද ඇස් කුලරත්න මාවත, කොළඹ 10, 1988, පිටු 24.
19. පීරිස්, ඥාණසිරි, ශාන්තිකර්ම හා අභිචාර විධි, වාසනා ප්‍රකාශකයෝ, දංකොටුව, 2009, පිටු 230.
20. විතාරණ, විනී බලි යාගය, මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ ප්‍රකාශනයකි, 1992, පිටු 6.
21. සේදරමන්, ජේ.ඊ, ලංකාවේ බලි උපත, සී/ස ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1967, පිටු 75.
22. පීරිස්, ඥාණසිරි, ශාන්තිකර්ම හා අභිචාර විධි, වාසනා ප්‍රකාශකයෝ, දංකොටුව, 2009, පිටු 231.
23. කාරියවසම්, තිස්ස, බලියාග පිළිවෙළ. සමයවර්ධන මුද්‍රණාලය, කොළඹ 10, 1986, පිටු 30.